මාධ්‍ය නිවේදනය
සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
|---|---|
| දිනය | 2021 සැප්තැම්බර් මස 27 දින |

# දැනුම්වත් කිරීමේ සටහන

## විදේශීය අංශයේ ස්ථායීතාව සහ සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා අපනයන ඉපැයීම් රට වෙත ගෙන්වා ගැනීමේ හා එම මුදල් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමේ වැදගත්කම

වසංගතයෙන් බලපෑමට ලක් වූ 2020 වසරට සාපේක්ෂව, 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ වෙළඳ අපනයන අංශය සැලකිය යුතු වැඩි දියුණු වීමක් පෙන්නුම් කර තිබේ. නවතම රේගු දත්තවලට අනුව, 2020 වසරේ එක්සත් ජනපද ඩොලර් මිලියන 837ක් වූ අපනයන ඉපැයීම්වල මාසික සාමාන්‍ය අගයට සාපේක්ෂව 2021 වසරේ අගෝස්තු මාසයෙන් අවසන් වූ මාස අට තුළ අපනයන ඉපැයීම්වල මාසික සාමාන්‍යය එක්සත් ජනපද ඩොලර් මිලියන 985ක් වූ අතර, 2021 වසරේ ජූනි-අගෝස්තු කාලය තුළ අපනයන ඉපැයීම්වල මාසික සාමාන්‍යය එක්සත් ජනපද ඩොලර් මිලියන 1,064ක් විය[1]. ශ්‍රී ලංකාව ඇතුළු බොහෝ රටවල විශාලතම විදේශ විනිමය උපයන්නා (විවිධ නිෂ්පාදනවලින් සමන්විත) වෙළඳ භාණ්ඩ අපනයන අංශය වන බැවින් මෙය අගය කළ හැකි ප්‍රවණතාවකි.

1977 වසරේ සිට සෑම වසරකම ශ්‍රී ලංකාවේ වෙළඳ හිඟයක් පැවති අතර, වෙළඳ භාණ්ඩ ආනයන සහ අපනයන අතර පරතරය, සාමාන්‍යයෙන් විදේශීය ජංගම ගිණුම වෙත වූ වෙනත් ලැබීම් (සංචාරක හා වෙනත් සේවා ලැබීම් සහ විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ වැනි) හා මූල්‍ය ලැබීම් (ආයෝජන සහ ණය ගැනීම් වැනි) මගින් මූල්‍යයනය කෙරෙයි.

මෙම පසුබිම තුළ, විශේෂයෙන් වසංගතය ආශ්‍රිත පීඩන හේතුවෙන් විදේශ විනිමය ලැබීමේ මෙවැනි අනෙකුත් ප්‍රධාන මාර්ග මත අයහපත් බලපෑම් ඇති වීමත් සමඟ, විදේශ විනිමය වෙළෙඳපොළ තුළ මෑතකාලීනව වූ ඇතැම් ප්‍රවණතා හේතුවෙන්, පහත විස්තර කෙරෙන පරිදි ගැටලු කිහිපයක් උද්ගතව තිබේ:

(අ) රේගුව විසින් වාර්තා කරන ලද එක්සත් ජනපද ඩොලර් මිලියන 985ක මාසික සාමාන්‍ය අපනයනවලට (භාණ්ඩ ප්‍රවාහ) සාපේක්ෂව, බැංකු විසින් වාර්තා කරන ලද පරිදි රට වෙත

[1] 2021 අගෝස්තු සඳහා වන තොරතුරු මූලික දත්ත වේ. මෙහි දැක්වෙන ශ්‍රී ලංකා රේගුවෙන් ලබා ගත් අපනයන සහ ආනයන පිළිබඳ දත්තවල, මහ බැංකුව විසින් සිදු කළ ගැළපීම් ද ඇතුළත් වේ.

ලැබී ඇති අපනයන ඉපැයීම්වල (මූල්‍ය ප්‍රවාහ) මාසික සාමාන්‍යය එක්සත් ජනපද ඩොලර් මිලියන 640ක් පමණ වේ. ඒ අනුව, මෙම අගයයන් දෙක අතර එක්සත් ජනපද ඩොලර් මිලියන 345ක පරතරයක් පවතී. එබැවින්, මෙම නිරීක්ෂණය අපනයනකරුවන් සිය අපනයන ඉපැයීම් සියයට සියයක් රට වෙත රැගෙන ආ යුතු බවට වන නියාමනයට අනුකූල වන්නේ ද යන බරපතල ප්‍රශ්නය මතු කරයි.

(ආ) විදේශ විනිමය අනුපාතිකයේ වෙනස්වීම් පිළිබඳව අනිසි සමපේක්ෂණ හේතුවෙන් 2020 වසරේ ජනවාරි සිට 2021 වසරේ ජූලි දක්වා කාලය තුළ අපනයන ඉපැයීම් රුපියල්වලට පරිවර්තනය කිරීමේ මැළිකමක් ඇති බව දක්නට ලැබුණු අතර, එමගින් දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ වෙත වන ලැබීම් සීමා වී, එහි ප්‍රතිඵලයක් ලෙස බැංකු අංශය සතු විදේශ විනිමය තැන්පතු ශේෂය එක්සත් ජනපද ඩොලර් බිලියන 1.9කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. මීට අමතරව, රට තුළ ණය මත අය කෙරෙන පොලී අනුපාතික පහළ මට්ටමක පැවතීම හේතුවෙන් ඇතැම් අපනයනකරුවන් සිය යෙදවුම් අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මුදල් ණයට ගෙන ආනයනය කිරීම වඩාත් වාසිදායක ලෙස සැලකූ අතර, එය වෙළෙඳපොළ මත තවදුරටත් පීඩන ඇති කළේය.

(ඇ) දැනට පවතින දත්ත මගින් පෙන්නුම් කරන පරිදි, අපනයන ඉපැයීම් සියයට සියයක් රට වෙත ලැබේ නම් සහ එම ඉපැයීම් සියයට සියයක් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කෙරේ නම්, දේශීය වෙළඳපොළ තුළට මාසිකව අපනයන ඉපැයීම් වශයෙන් ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර් මිලියන 985ක් විය හැකිව තිබූ අතර, එක්සත් ජනපද ඩොලර් මිලියන 1,670ක් වන මාසික සාමාන්‍ය ආනයන වියදම සමඟ, අපනයන ඉපැයීම් සහ ආනයන වියදම් අතර මාසික සාමාන්‍ය පරතරය එක්සත් ජනපද ඩොලර් මිලියන 685ක් විය හැකිව තිබුණි. එය රට වෙත ලැබෙන වෙනත් විදේශ විනිමය ලැබීම් භාවිත කිරීමෙන් පහසුවෙන් මූල්‍යනය කර ගත හැකිව තිබුණි.

(ඈ) පොදු වශයෙන් පසුගිය සංඛ්‍යාලේඛන මගින් සහ විශේෂයෙන් 2021 ජූලි/අගෝස්තු කාලය තුළ ලැබූ අත්දැකීම් මගින් පෙන්නුම් කරන පරිදි, අපනයන ඉපැයීම් සම්පූර්ණ වශයෙන් මෙරටට රැගෙන නොඒම හේතුවෙන් සාමාන්‍යයෙන් මාසයක දී ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කෙරෙන අපනයන ඉපැයීම් ප්‍රමාණය සහ ආනයන වියදම අතර පවතින පරතරය බෙහෙවින් ඉහළ ය.

අපනයන කටයුතු තුළින් ජනනය වන විදේශ විනිමය නිසි පරිදි රටට ගෙන්වා ගැනීම සහ එය දේශීය මුදලට පරිවර්තනය කිරීම සහතික කිරීම සඳහා රටකට අවශ්‍යතාවක් ඇති බව සඳහන් කිරීම ද යුක්ති සහගත ය. එම නිසා, බොහෝ නැගී එන වෙළඳපොළ ආර්ථික තුළ වෙළඳ භාණ්ඩ හා සේවා අපනයන ඉපයීම් සිය රට වෙත ගෙන්වා ගැනීමේ සහ දේශීය මුදල් ඒකකවලට පරිවර්තනය කිරීමේ අවශ්‍යතා පනවා ඇත. රටකින් රටකට අත්දැකීම් වෙනස් වන අතර,

කාලයාගේ ඇවෑමෙන්, එවැනි ණය නොවන ගලා ඒම් තුළින් රටක විදේශ විනිමය සංචිත ගොඩනැගීමත් සමඟම, රටවල් මෙකී අවශ්‍යතා ක්‍රමයෙන් ලිහිල් කර ඇත. බංගලාදේශය, ඉන්දියාව, ඉන්දුනීසියාව, මැලේසියාව, නේපාලය, පකිස්තානය සහ තායිලන්තය වැනි කලාපීය ආර්ථිකයන්හි වර්තමානයේ පනවා ඇති අපනයන ඉපැයීම් සිය රටවල් වෙත ගෙන්වා ගැනීමේ අවශ්‍යතා අපනයනය කළ දින සිට මාස 3 හා අවුරුදු 2 අතර පරාසයක පවතී. බංගලාදේශය, ඉන්දියාව, පකිස්තානය සහ තායිලන්තය යන රටවල භාණ්ඩ හා සේවා යන ද්විත්වයම මත අපනයන ඉපැයීම් සිය රට වෙත ගෙන්වා ගැනීමේ අවශ්‍යතා පනවා ඇති අතර, නේපාලය, මැලේසියාව සහ ඉන්දුනීසියාව යන රටවල භාණ්ඩ අපනයන සඳහා පමණක් එම අවශ්‍යතාව පනවා ඇත. බංගලාදේශය, ඉන්දියාව, පාකිස්තානය සහ තායිලන්තය යන රටවල්, සිය රට වෙත රැගෙන එන අපනයන ඉපැයීම් ප්‍රමාණය සහ එහි ස්වභාවය මෙන්ම ඒවායේ භාවිතය මත පදනම්ව, එම අපනයන ඉපැයීම් විවිධ ප්‍රතිශතවලින් අදාළ රටේ දේශීය මුදල් ඒකක බවට පරිවර්තනය කිරීම සඳහා නීති පනවා ඇත. අපනයන ඉපැයීම් රට වෙත ගෙන ඒම සහ දේශීය මුදල් ඒකකවලට පරිවර්තනය කිරීම සඳහා වන අවශ්‍යතා එසේ පැනවීම මගින් අපනයන අංශය සඳහා සෘජුවම අවශ්‍ය වන අතරමැදි හා ආයෝජන භාණ්ඩ ආනයන මෙන්ම, අපනයන අංශය ඇතුළු සියලු අංශ සඳහා වක්‍ර යෙදවුම් වන රටට අත්‍යවශ්‍ය ඉන්ධන සහ වෛද්‍ය අවශ්‍යතා ආනයන සඳහා වන විදේශ විනිමය ඉල්ලුම සපුරාලීම සහතික කෙරේ.

එබැවින්, අපනයනවල සැබෑ අරමුණ සාක්ෂාත් වන පරිදි, සාධාරණ කාලයක් තුළදී අපනයන ආදායම සම්පූර්ණයෙන්ම රට වෙත ගෙන්වා ගැනීම සහ, අපනයනකරුවන්ගේ ගිණුම්වල දැනටමත් ඒකරාශී වී තිබෙන අපනයන ඉපැයීම් ලැබීම් ද ඇතුළුව, එලෙස රට වෙත ලැබෙන අපනයන ආදායම් දේශීය මුදල් බවට පරිවර්තනය කිරීම සහතික කිරීම සඳහා (බදු අඩු කිරීම සහ අනෙකුත් උත්තේජන ගණනාවක් ලබා දීම ඔස්සේ අපනයන අංශයට සහාය වන) රජය සහ (මිල සහ ආර්ථික ස්ථායීතාව මෙන්ම මූල්‍ය පද්ධති ස්ථායීතාව තහවුරු කිරීම අපේක්ෂා කෙරෙන) මහ බැංකුව පියවර ගැනීම සාධාරණ වනු ඇත.

පොදුවේ පිළිගත හැකි කරුණක් නම් අපනයනයකට එහි අරමුණ ළඟා කරගත හැක්කේ, අපනයනය මගින් ජනනය කෙරෙන විදේශ විනිමය ප්‍රවාහය අවසානයේ රටේ මූල්‍ය පද්ධතිය තුළට දේශීය ව්‍යවහාර මුදල් ලෙස ඇතුළත් වීමෙන් පසුව යන්නයි. අපනයන ඉපැයීම් අවසාන වශයෙන් දේශීය ව්‍යවහාර මුදල්වලට පරිවර්තනය නොවන්නේ නම් මෙම අරමුණ සාක්ෂාත් කරගත නොහැකි වනු ඇත. ඒ අනුව, මෙම අරමුණ ළඟා කර ගැනීමට මග පාදන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අධීක්ෂණය සහතික කිරීම සඳහා අවශ්‍ය පද්ධති ශක්තිමත් කිරීම සම්බන්ධයෙන් පියවර ගත යුතුව ඇත. අපනයන තුළින් සැපයෙන විදේශ විනිමය ද්‍රවශීලතාව සහ ආනයන සඳහා වන විදේශ විනිමය ද්‍රවශීලතා ඉල්ලුම අතර මාසික සාමාන්‍ය පරතරය මහ බැංකුව සිය වාර්තා මගින් ප්‍රකාශයට පත්කර ඇති මට්ටම් දක්වා අඩුකරගත හැකි වනු ඇත්තේ එවිට ය.